# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,787 - 2012 නොවැම්බර් මස 30 වැනි සිකුරාදා - 2012.11.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | — |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1194 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.-* (i) ජම් ඉය්යතුස් සහ්වා අල්-හයිරිය්‍යා (ජස්කා) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2012 ඔක්තෝබර් මස 05 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) හැන්ඩ්ස් ෆෝ එඩියුකේෂන් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2012 ඔක්තෝබර් මස 05 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 දෙසැම්බර් මස 21 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 දෙසැම්බර් මස 07 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*).

2012 ජුනි මස 23 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## මහජන බැංකුව - මහවැව ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.03.26 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මාරවිල ප්‍රසිද්ධ නොතාරිස් රුවිනි ඒ. එස්. දසනායක මහත්මිය විසින් සහතික කරන ලද 2008.06.27 දිනැති අංක 6588 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, සුහසිංහ ආරච්චිගේ රමේෂ් අජන්ත කුමාර සුහසිංහ යන අය විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් දහතුන් ලක්ෂ හැත්තෑපන් දහස (රු.1,375,000) ක මුදලක් අයවීමට ඇති බැවින්ද, 2008.12.17 වැනි දින සිට වර්ෂයකට 23% බැගින් රුපියල් දහතුන් ලක්ෂ හැත්තෑපන් දහස (රු.1,375,000) ක මුදල සඳහා පොළිය ද, වෙන්දේසි දිනය තෙක් තව දුරටත් පොළිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අය කරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම්, ඒවා අඩුව එකී රුපියල් දහතුන් ලක්ෂ හැත්තෑපන් දහස (රු.1,375,000) ක මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතා විසින් එකී අංක 6588 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පණතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තරය

1. වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත්, උතුරු පිටිගල් කෝරලේ, යගම් පත්තුවේ, මැදගම නමැති ගමේ පිහිටි කහටගහහේන්යාය හෙවත් කුඹුක්ගහහේන්යාය, මැදගමහේන්යාය, කදුරුගහවෙලවත්ත, සූරියගහවත්ත හෙවත් කහටගහවත්ත නැමති ඉඩමට පී. තංගවඩිවේලු, බලයලත් මානක තැන විසින් වර්ෂ 2001.08.23 වැනි දින මැන සාදන ලද අංක 1863 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 02 දරන කොටසට මායිම්, උතුරට : මාදම්පේ සිට විලත්තවට යන ප්‍රධාන පාර සහ ඒ. ජී. එස්. බී. පරාක්‍රම බලයලත් මානක තැනගේ අංක 1215 ඒ දරන පිඹුරේ ලොට් 02 දරන කොටස ද, නැගෙනහිරට : ඒ. ජී. එස්. බී. පරාක්‍රම බලයලත් මානක තැනගේ අංක 1215 ඒ දරන පිඹුරේ ලොට් 02 දරන කොටස් සහ ඉහත පිඹුර අනුව ලොට් අංක 01 දරන කොටස ද, දකුණට : ඉහත පිඹුර අනුව ලොට් අංක 01 දරන කොටස සහ ඩී. පී. විමලසේන බලයලත් මානක තැනගේ අංක 1522 දරන පිඹුර අනුව ලොට් අංක 01 දරන කොටස ද, බස්නාහිරට : ඩී. පී. විමලසේන බලයලත් මානක තැනගේ අංක 1522 දරන පිඹුර අනුව ලොට් අංක 01 දරන කොටස සහ මාදම්පේ සිට විලත්තව ප්‍රධාන පාර ද යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් බිංදුව (අක්. 0, රූ. 1, පර්. 0) ක් විශාල ඉඩමේ බිම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පලතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලුදේත් මේ සමග වේ.

ඉහත කී ඉඩම පහත පරිදි නැවත මැන සාදා ඇත.

ඉහත කී මැදගම නමැති ගමේ පිහිටි කහටගහහේන්යාය, නොහොත් කුඹුක්ගහහේන්යාය, මැදගමහේන්යාය, කොටසක්, කදුරුගහවගල නොහොත් ජංගයාගේවත්ත, කොටසක් සහ හූරියගහවත්ත නොහොත් කහටගහවත්ත නමැති ඉඩමට එස්. ඒ. ආනන්ද විමලවීර බලයලත් මානක තැන විසින් වර්ෂ 2008.02.07 වැනි දින මැන සාදන ලද අංක 110 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 01 දරන කොටසට මායිම්, උතුරට : මාදම්පේ සිට මැදගම දක්වා දිවෙන මාර්ග සංවර්ධන අධිකාරියට අයත් පාර සහ එස්. ඒ. ලක්ෂ්මන් තිලක්කුමාර සුහසිංහට අයිති ඉඩම ද, නැගෙනහිරට : එස්. ඒ. ලක්ෂ්මන් තිලක්කුමාර සුහසිංහට අයිති ඉඩම සහ ඩී. ආර්. නෙවිල් ප්‍රනාන්දුට අයිති ඉඩම ද, දකුණට : ඩී. ආර්. නෙවිල් ප්‍රනාන්දු සහ එම්. එම්. චන්ද්‍රසේකරට අයිති ඉඩම ද, බස්නාහිරට : එම්. එම්. චන්ද්‍රසේකරට අයිති ඉඩම සහ මාදම්පේ සිට මැදගමට යන මාර්ග සංවර්ධන අධිකාරියට අයිති පාර ද යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් බිංදුව (අක්. 0, රූ. 1, පර්. 0) ක් හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම එකයි බිංදුවයි එකයි දෙක (හෙක්. 0.1012) ක් විශාල ඉඩමේ බිම සහ ඊට අයත් ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් මේ සමග වේ.

මෙය හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ R67/218 හි ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමණාකාර - පුත්තලම.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 79- මාරවිල පාර,
නාත්තන්ඩිය.

11-1115

---

## මහජන බැංකුව - අකුරුස්ස ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 "ඩී" වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 "ඩී" වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.11.27 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මාතර ප්‍රසිද්ධ නොතාරිස් ටී. එන්. රුබසිංහ මහත්මිය විසින් සහතික කරන ලද 2006.11.27 දිනැති අංක 3734 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් හේවා යද්දෙහිගේ රෝහණ චන්ද්‍ර කුමාර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කර අංක 3734 යටතේ රුපියල් පහළොස් ලක්ෂ තිස්දෙදහස් හත්සිය හතලිස් හතරයි ශත අනූතුනක (රු.15,32,744.93) මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2009.01.15 වැනි දින සිට වර්ෂයට සියයට විසි දෙක (22%) බැගින් රුපියල් පහළොස්ලක්ෂ තිස්දෙදහස් හත්සිය හතලිස් හතරයි ශත අනූතුනක (රු.15,32,744.93) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය සහ අදාළ මහජන බැංකු පනෙත් 29 "එල්" වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම්, ඒවා අඩුව රුපියල් පහළොස්ලක්ෂ තිස්දෙදහස් හත්සිය හතලිස් හතරයි ශත අනූතුනක (රු.15,32,744.93) මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 3734 දරන උකස්කර යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ

විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**දේපළ පිළිබඳ විස්තර**

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළයේ, මාලිම්බඩ පිහිටි ආදිකාරිවිල හෙවත් අදිකාරිවිලවත්ත අංක 01 දරන කැබැල්ලේ කොටසක් බෙදූ අංක 02 දරන ඉඩම් කැබැල්ල ඉහත ඉඩමේ අංක 01 දරන කොටසින් බෙදූ අංක 07 දරන ඉඩම් කැබැල්ල බෙදූ 7-ඒ සහ 7-බී දරන ඉඩම් කැබලි ඒකාබද්ධව ඊ. එම්. ප්‍රේමසිරි බලයලත් මිනින්දෝරු මහතා විසින් 2006.10.27 වැනි දින මැන සාදන ලද අංක 1209 දරන පිඹුරේ "ඒ" අක්ෂරය දරන ඉඩම් කැබැල්ලට එකී පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : අකුරැස්ස, මාතර ප්‍රධාන මාර්ගය සහ මෙම ඉඩමේ අංක 03, 04 සහ 06 දරන ඉඩම් කැබැලි ද, නැගෙනහිරට : මෙම ඉඩමේ අංක 03 දරන ඉඩම් කැබැල්ල, පාර සහ අංක 07 බෙදූ අංක 7 සී දරන ඉඩම් කැබැලි ද, දකුණට : මෙම ඉඩමේ අංක 07 බෙදූ 7සී දරන ඉඩම් කැබැලි ද, බටහිරට : මෙම ඉඩමේ අංක 01 එ 8 සහ 11 දරන කැබැලි ද, යන මායිම් තුළ පිහිටි පර්චස් තිස්එකක් (අක්. 0, රූඩ් 0, පර්. 31) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි වැවිලි ගොඩනැගිලි යනාදී සෑම සියලු දෑයද වේ.

මෙම ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 1108/55/හි ලේඛනගතව ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමණාකරු (මාතර).

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 215, අනගාරික ධර්මපාල මාවත,
නූපේ -මාතර.

11-1117

---

**ඩීඑෆ්සීසී බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2012 සැප්තැම්බර් මස 26 වැනි දිනදී ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

ඩීඑෆ්සීසී බැංකුව නමට පොළොන්නරුව ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ. අභයවර්ධන විසින් ලියා සහතික කළ අංක 955 හා 2008 මැයි 06 වැනි දින ද, පොළොන්නරුවේ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ. අභයවර්ධන, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ගුණරත්න සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එස්. ගනේගොඩ ලියා සහතික කළ අංක 1225/1173 හා 2009 සැප්තැම්බර් මස 02/2009 සැප්තැම්බර් මස 28/2009 සැප්තැම්බර් මස 30 වැනි දින දරන උකස් බැඳුම්කරය සහ අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් එන්. ඒ. කුරේරා ලියා සහතික කළ අංක 4543, 4544, 4545 හා 4546 සහ 2010 නොවැම්බර් මස 08 වැනි දින දරන සියලු උකස් බැඳුම්කර මත, අයවිය යුතු මුදල් ගෙවීම, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යථා පරිදි සංස්ථාගත කර තිබෙන්නා වූ හා ලියාපදිංචි කාර්යාලය පොළොන්නරුව, කාලිංග ඇළ, අංක 462 දරන ස්ථානයේ පිහිටා තිබෙන්නා වූ (මෙහි මින් ඉදිරියට "එකී සමාගම") යනුවෙන් සඳහන් කරනු ලබන) මිහිරි රයිස් ප්‍රොඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2012 ජූනි මස 30 වැනි දිනට එකී මිහිරි රයිස් ප්‍රොඩක්ට්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගමෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් තුන්කෝටි තිස්දෙලක්ෂ අසූදෙදහස් දෙසිය හැටපහකුත් ශත හැත්තෑ දෙකක (රු. 3,32,82,265.72) මුදලක් සහ 2012 ජූලි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් පනස් හත් ලක්ෂ විසිහත් දහස් නවසිය තිස් අටක් (රු.57,27,938.00) සඳහා වර්ෂයකට සියයට දහතුන (13.0%) බැගින් පොළිය ද රුපියල් අනූනවලක්ෂ අනූනවදහස් නවසිය අසූහතරක් (රු.99,99,984.00) සඳහා වර්ෂයකට සියයට දහතුනකුත් දශම තුනයි එක (13.31%) බැගින් පොළිය ද රුපියල් හතලිස් හතර ලක්ෂ හැත්තෑ නව දහස් එකසිය හැට පහක් (රු.44,79,165.00) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරන පහත දැක්වෙන පාදක පොළී අනුපාතික අතරින් එනම්,

* බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය ; හෝ
* රඳවා ගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු, දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතිකයට ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය ;

යන පාදක පොළී අනුපාතික අතරින් ප්‍රතිශෝධන දිනයේ පැවති වඩා ඉහල අනුපාතිකයට සියයට අටක (8%) ආන්තිකයක් එකතු කළ වාර්ෂික අනුපාතිකය මත පොළියද රුපියල් එක්කෝටියක් (රු.1,00,00,000) සඳහා එකී පාදක පොළී අනුපාතික අතරින් ප්‍රතිශෝධන දිනයේ පැවති වඩා ඉහල අනුපාතිකයට සියයට හතකුත් දශම පහක (7.5%) ආන්තිකයක් එකතු කළ වාර්ෂික අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල රුපියල් තුන්කෝටි තිස්දෙලක්ෂ අසූදෙදහස් දෙසිය හැටපහකුත් ශත හැත්තෑ දෙකක (රු.3,32,82,265.72) මුදලක් සහ 2012 ජූලි 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් පනස් හත් ලක්ෂ විසිහත් දහස් නවසිය තිස් අටක් (රු.57,27,938.00) සඳහා වර්ෂයකට සියයට දහතුන (13.0%) බැගින් පොළිය ද රුපියල් අනූනවලක්ෂ අනූනවදහස් නවසිය අසූහතරක් (රු.99,99,984.00) සඳහා වර්ෂයකට සියයට දහතුනකුත් දශම තුනයි එක (13.31%) බැගින් පොළියද රුපියල් හතලිස් හතර ලක්ෂ හැත්තෑනව දහස් එකසිය හැට පහක් (රු.44,79,165.00) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරන පහත දැක්වෙන පාදක පොළී අනුපාතික අතරින් එනම් :

* බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. ආර්) ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය ; හෝ
* රඳවා ගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු, දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතිකයට ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය ;

යන පාදක පොළී අනුපාතික අතරින් ප්‍රතිශෝධන දිනයේ පැවති වඩා ඉහළ අනුපාතිකයට සියයට අටක (8%) ආන්තිකයක් එකතු කළ වාර්ෂික අනුපාතිකය මත පොළියද රුපියල් එක්කෝටියක් (රු.1,00,00,000) සඳහා එකී පාදක පොළී අනුපාතික අතරින් ප්‍රතිශෝධන දිනයේ පැවති වඩා ඉහළ අනුපාතිකයට සියයට හතකුත් දශම පහක (7.5%) ආන්තිකයක් එකතු කළ වාර්ෂික අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී අංක 955, 1225/1173, 4543, 4544, 4545, සහ 4546 දරන උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 955 සහ 4543 දරන උකස් බැඳුම්කර මගින් සමාගමේ අධ්‍යක්ෂවරියක වන යාපා වාසල ගැමුණුගේ ඉන්ද්‍රානි කුලසිංහ විසින් ද අංක 1225/1173 හා 4544 සහ 4545 දරන උකස් බැඳුම්කර මගින්, සමාගමේ අධ්‍යක්ෂවරයෙකු වන පටබැඳි මද්දුමගේ රොෂාන් ජනක ද සිල්වා විසින් ද අංක 4546 දරන උකස් බැඳුම්කරය මගින් මිහිරි රයිස් ප්‍රොඩක්ට්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගම විසින් ද ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය හා එහි ඇති ව්‍යාපාර බඩුතොග, යන්ත්‍ර සූත්‍ර හා වෙනත් සියලු දේ කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

### අංක 955 සහ 4543 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැද පත්තුවේ, පලුගස්දමන ග්‍රාමයේ 3 ඇළ අංක 175 ඇළ (3rd Channel 175) පිහිටි, සර්වේයර් ජනරාල්වරයා මැන සකස් කළ F. C. P. Po. 20 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 256 ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටිය වන, උතුරට : ලොට් අංක 245 හා 246 ද, නැගෙනහිරට : ලොට් අංක 255 ද, දකුණට : ලොට් අංක 281 ද බස්නාහිරට : ලොට් අංක 281, 243 සහ 245 ද යන මායිම් ඇතුළත අක්කර හතරකුත් රූඩ් දෙකකුත් පර්චස් අටක් (අ. 4, රූ, 2, පර්. 8) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේ.

මෑතකදී කරනු ලැබූ මැනීමකට අනුව මෙම ඉඩම පහත දැක්වෙන පරිදි විස්තර කර තිබේ.

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැද පත්තුවේ, පලුගස්දමන ග්‍රාමයේ පිහිටි (සර්වේයර් ජනරාල්වරයා මැන සකස් කළ අංක F. C. P. Po. 20 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 256 දරන ඉඩමේ අනුබෙදීමක් වන) බලයලත් මිනින්දෝරු ඩී. මුදුන්කොත්ගේ මැන සකස් කළ අංක 2124 හා 2008 ජනවාරි මස 20 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 1 සහ 2 ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටියට මායිම්, උතුරට : F. C. P. Po. 20 දරන පිඹුරේ ලොට් අංක 245 සහ 246 ද, නැගෙනහිරට : F. C. P. Po. 20 දරන පිඹුරේ ලොට් අංක 246 සහ 255 ද, දකුණට : F. C. P. Po. 20 දරන පිඹුරේ ලොට් අංක 255 සහ 281 ද, බස්නාහිරට : F. C. P. Po. 20 දරන පිඹුරේ ලොට් අංක 281 ද යන මායිම් ඇතුළත අක්කර හතරකුත් රූඩ් දෙකකුත් පර්චස් 8 ක් (අ. 4, රූ. 2, පර්. 8) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමේ බිම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගසකොළ, වැව්ලි සහ වෙනත් සියලු දේ.

### අංක 1225/1173, 4544, 4545 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැද පත්තුවේ, පලුගස්දමන ග්‍රාමයේ 3 ඇළ අංක 175 (3rd channel 175) සර්වේයර් ජනරාල්වරයා මැන සකස් කළ F. C. P. Po. 20 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 255 දරන බෙදා වෙන්කළ බිම් කට්ටිය වන, උතුරට : ලොට් අංක 246 හා 247 ද, නැගෙනහිරට: ලොට් අංක 248 ද, දකුණට : ලොට් අංක 248 හා 281 ද, බස්නාහිරට : ලොට් අංක 256 ද යන මායිම් ඇතුළත අක්කර හතරකුත් රූඩ් එකකුත් පර්චස් විසිහයක් (අ. 4, රූ. 1, පර්. 26) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමේ බිම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගසකොළ, වැව්ලි සහ වෙනත් සියලු දේ.

මෑතකදී කරනු ලැබූ මැනීමකට අනුව මෙම ඉඩම පහත දැක්වෙන පරිදි විස්තර කර තිබේ.

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැද පත්තුවේ, පලුගස්දමන ග්‍රාමයේ පිහිටි (සර්වේයර් ජනරාල්වරයා මැන සකස් කළ අංක F. C. P. Po.20 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 255 දරන ඉඩමේ අනුබෙදීමක් වන) බලයලත් මිනින්දෝරු ඩී. මුදුන්කොත්ගේ මැන සකස් කළ අංක 2125 හා 2008 ජනවාරි මස 20 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 1 සහ 2 ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටියට මායිම්, උතුරට : F. C. P. Po.20 දරන පිඹුරේ ලොට් අංක 246 හා 247 ද, නැගෙනහිරට : F. C. P. Po.20 දරන පිඹුරේ ලොට් අංක 248 ද, දකුණට : F. C. P. Po.20 දරන පිඹුරේ ලොට් අංක 248 සහ 281 ද, බස්නාහිරට : F. C. P. Po.20 දරන පිඹුරේ ලොට් අංක 256 ද යන මායිම් ඇතුළත අක්කර හතරකුත් රූඩ් එකකුත් පර්චස් විසිහයක් (අ. 4, රූ. 1, පර්. 26) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමේ බිම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගසකොළ, වැව්ලි සහ වෙනත් සියලු දේ.

| | | ඒකක සංඛ්‍යාව |
|---|---|---|
| 1. | පැඩි ඩ්‍රයර් කි. ග්‍රෑ 25,000 | 1 |
| 2. | බොයිලර් | 1 |
| 3. | කෝන්ස් (වී දහයියා සහ අළු) | 2 |
| 4. | මොඩර්න් පාර් බොයිලිං සිස්ටම්(Per Boiling System) | 1 |
| 5. | රබර් හලර් | 2 |
| 6. | පැඩි කූලිං ෆෑන් | 1 |
| 7. | පැඩි ක්ලීනර් | 1 |
| 8. | ඩී ස්ටොනර් | 1 |
| 9. | රයිස් සෙපරේටර් | 1 |
| 10. | පොලිෂර් සහ ඩස්ට් ෆෑන් | 1 |
| 11. | පොලිෂර් සහ ඩස්ට් ෂිෆ්ටර් | 1 |
| 12. | රයිස් ග්‍රේඩර් සහ ස්ටොක් ටෑන්ක් | 1 |
| 13. | රයිස් පවුඩර් මැෂින් | 1 |
| 14. | එළිවේටර් | 1 |
| 15. | එළිවේටර් | 4 |
| 16. | එළිවේටර් | 4 |
| 17. | අ. බ. 30 මෝටර් | 2 |
| 18. | අ. බ. 25 මෝටර් | 1 |
| 19. | අ. බ. 3 මෝටර් | 3 |
| 20. | අ. බ. 2 මෝටර් | 16 |
| 21. | අ. බ. 4 මෝටර් | 2 |
| 22. | මේන් ස්විච් | 1 |
| 23 | සර්කිට් බ්‍රේකර් | 1 |
| 24. | ඔයිල් බාත් ස්ටාටර් | 4 |
| 25. | ඩස්ට් පාර්ටිකල් කලෙක්ටර්, බකට් එළිවේටර් සහ ඩස්ට් කලෙක්ෂන් හුඩ් | 1 |
| 26. | පාර් බොයිලිං සිස්ටම් විත් ටෑන්ක්ස්, පයිපිං සහ ෆිටින්ස් ආදී | 1 |

27. ස්ටීම් ජෙනරේටර් විත් ස්මෝක් එලිමිනේෂන් සිස්ටම් 1

**අංක 4546 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද ව්‍යාපාර බඩු තොග**

ශ්‍රී ලංකා ජනරජයේ, උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, පොළොන්නරුවේ, කාලිංග ඇළ අංක 462 දරන ස්ථානයේ, මිහිරි රයිස් ප්‍රඩක්ට්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගම් පරිශ්‍රයේ දැනට ගබඩාකර තබා තිබෙන, සියළු බඩුතොග සහ වෙනත් අයිතමයන් හා සෑම ආකාරයකම සහ කවර හෝ විස්තරයකට අයත් චංචල දේපළ ඇතුළුව, සියළු ව්‍යාපාරික බඩුතොග, වෙළඳ ද්‍රව්‍ය, බඩුබාහිරාදිය හා දේවල්, අමුද්‍රව්‍ය, ප්‍රගාමී වැඩ, නිමි භාණ්ඩ සහ නිමහම් නොකල භාණ්ඩ සහ බන්ධනදායී විසින් දැනට හෝ මතුවට යම් අවස්ථාවක හෝ මතු කවර හෝ අවස්ථාවක සහ කලින් කල සිය ව්‍යාපාරය කරගෙන යනු ලැබිය හැකි වෙනත් සියලු ගුදම්, ගබඩා සහ පරිශ්‍රවල හෝ ඒ කිසිවක් මත දමා හෝ තබා තිබෙන හෝ එකී ව්‍යාපාර බඩු තොග, වෙළඳ ද්‍රව්‍ය, බඩු බාහිරාදිය සහ දේවල්, අමුද්‍රව්‍ය, ප්‍රගාමී වැඩ, නිමි භාණ්ඩ සහ නිමහම් නොකළ භාණ්ඩ සහ යම් කාලයක හෝ කලින් කල හා සෑම කල්හිම ඒවායේ ගබඩා කර, දමා හෝ තබා තිබිය හැකි කවර හෝ වර්ගයක හෝ ස්වභාවයක වූ වෙනත් සියලු අයිතම හා වෙනත් චංචල දේපළ ද මෙම බැඳුම්කරය බලාත්මකව පවතින කාලය ඇතුළත කලින් කල හෝ සෑම කල්හිම ඉහත කී ගුදම්, ගබඩා හා පරිශ්‍රවලට ගෙනැවිත් දමා, තබා හෝ ගබඩාකර තබනු ලැබිය හැකි බන්ධනදායීන්ගේ සියලු ව්‍යාපාර බඩු, වෙළඳ ද්‍රව්‍ය, බඩු බාහිරාදිය සහ දේවල්, අමුද්‍රව්‍ය, ප්‍රගාමී වැඩ, නිමි භාණ්ඩ හා නිමහම් නොකළ භාණ්ඩ, හා කවර හෝ වර්ගයක හෝ ස්වභාවයක වූ වෙනත් සියලු අයිතම හා චංචල දේපළ ද බන්ධනදායී විසින් මින් මතු යම් කාලයක සහ කලින් කල සිය ව්‍යාපාරය හෝ කර්මාන්තය ඉවත් කරගෙන යනු ලැබිය හැකි හෝ ව්‍යාපාරය කරගෙන යනු ලැබිය හැකි නැතහොත් එකී ව්‍යාපාර බඩුතොග, වෙළඳ ද්‍රව්‍ය බඩු බාහිරාදිය සහ දේවල් හා අමුද්‍රව්‍ය, ප්‍රගාමී නිමි භාණ්ඩ හා වෙනත් සියලු අයිතම සහ වෙනත් චංචල දේපළ ගබඩා කර තබනු ලැබිය හැකි වෙනත් යම් ස්ථානයක හෝ ස්ථානවල ඇති බන්ධනදායීගේ එකී සියලු දේපළ ද, ඉහත කී ගුදම්, ගබඩා සහ පරිශ්‍ර හෝ ව්‍යාපාර ස්ථානවලින් හෝ ඒවාට හෝ ගෙනඑමින් හෝ ගෙනයමින් ප්‍රවාහණාන්තරව පවතින නැතහොත් එකී ජනරජයේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වාප්පුවේ හෝ ගුදම්වල නැව්ගත කිරීමේ හෝ නිශ්කාෂනය අපේක්ෂාවෙන් තිබෙන බන්ධනදායීගේ එකී සියලු දේපල ද වේ.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

11-1110

---

**ඩීඑෆ්සීසී බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2012 සැප්තැම්බර් මස 26 වැනි දින දී ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

ඩීඑෆ්සීසී බැංකුව නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. වලතර ලියා සහතික කළ අංක 170 හා 1995 අගෝස්තු 15 වැනි දින ද, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජී. රණමුකආරච්චි ලියා සහතික කළ අංක 516 හා 1996 ජූලි 22 වැනි දින ද, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඊ. අයි. ජෝර්ජ් ලියා සහතික කළ අංක 278 හා 1997 නොවැම්බර් මස 25 වැනි දින ද, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එස්. විජේසේකර ලියා සහතික කළ අංක 996 හා 1998 මාර්තු 10 වැනි දින ද, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. වලතර ලියා සහතික කළ අංක 818 සහ 2000 ඔක්තෝබර් 02 වැනි දින ද කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එස්. පී. කොඩිතුවක්කු ලියා සහතික කළ අංක 247 හා 248 හා 2003 අගෝස්තු මස 25 වැනි දින දරන උකස් බැඳුම්කර දෙක ද යන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, දෙවලපොල, ගනිහිමුල්ල, වලව්ව පාර, අංක 01/A දරන ස්ථානයේ පිහිටි, "සෙන්ට් ක්‍රිස්ටෝෆර් පෝල්ට්‍රි ෆාම්" යන නාමය අභිධානය සහ ආයතනය යටතේ ව්‍යාපාරය කරගෙන යන චන්ද්‍රලතා තන්ත්‍රිගේ සන්තෝස් නොහොත් චන්ද්‍රලතා සන්තෝස් විවාහයට පෙර තන්ත්‍රිගේ යන අය විසින් පැහැර ඇති හෙයින් ද,

2012 මැයි මස 31 වැනි දිනට එකී චන්ද්‍රලතා තන්ත්‍රිගේ සන්තෝස් නොහොත් චන්ද්‍රලතා සන්තෝස් විවාහයට පෙර තන්ත්‍රිගේ යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් එක්කෝටි අනූනවලක්ෂ හතලිස් හතර දහස් දෙසීය හැත්තෑ හතරකුත් ශත හැට එකක (රු.1,99,44,274.61) මුදලක් සහ 2012 ජූනි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් තිස් තුන් දහස් තුන්සිය තිස්දෙකක (රු.33,332.00) මුදලක් සඳහා සහ රුපියල් අසූදෙදහස් අටසීයක (රු.82,800) මුදලක් සහ රුපියල් හතලිස් දෙදහස් පන්සිය පනහක (රු.42,550) මුදලක් සහ රුපියල් අසූහත්දහස් නවසිය හතකුත් ශත දහහතරක (රු.87,907.14) මුදලක් සඳහා වර්ෂයකට සියයට දාහතර (14%) බැගින් පොළිය ද රුපියල් තුන්ලක්ෂ අසූහත් දහස් පන්සියයක (රු.387,500) මුදලක් සහ රුපියල් එක්ලක්ෂ විසි දෙදහස් හයසිය හැට අටක (රු.122,668) මුදලක්, රුපියල් තුන් ලක්ෂ විසිහත්දහස් තුන්සිය තිස්දෙකක් (රු.327,332) සහ රුපියල් හාරලක්ෂ අනූපන්දහස් (රු.495,000) සඳහා එක් එක් වර්ෂයේ සෑම හයමසකට වරක් අප්‍රේල් සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරන සති විසිහතරේ බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහල අනුපාතිකයක් වන අනුපාතිකයක් වන ආසන්නතම ඉහල වාර්ෂික අනුපාතිකය ලෙස 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොලිය ද රුපියල් හතලිස් ලක්ෂයක් (රු.40,00,000) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරන බර තැබූ සති දොළහේ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්), වර්ෂයකට සියයට අටක් (8%) ඉහත අනුපාතිකය වාර්ෂික අනුපාතිකය ලෙස 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොළිය ද රුපියල් පහලොස් ලක්ෂයක් රු. (15,00,000) සඳහා වර්ෂයකට සියයට විස්ස (20%) බැගින් පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල රුපියල් එක්කෝටි අනූනවලක්ෂ හතලිස් හතර දහස් දෙසීය හැත්තෑ හතරකුත් ශත හැට එකක (රු.1,99,44,274.61) මුදලක් සහ 2012 ජූනි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් තිස් තුන් දහස් තුන්සිය තිස් දෙකක (රු.33,332) මුදලක් සඳහා සහ රුපියල් අසූදෙදහස් අටසීයක (රු.82,800) ක මුදලක් සහ රුපියල් හතලිස් දෙදහස් පන්සිය පනහක (රු.42,550) මුදලක් සහ රුපියල් අසූහත්දහස් නවසිය හතකුත් ශත දහහතරක් (රු.87,907.14) මුදලක් සඳහා වර්ෂයකට සියයට දහහතර (14%) බැගින් පොළිය ද රුපියල් තුන්ලක්ෂ අසූහත් දහස් පන්සියයක (රු.387,500.00) මුදලක් සහ රුපියල් එක්ලක්ෂ විසි දෙදහස් හයසිය හැට අටක (රු.122,668) මුදලක්, රුපියල් තුන් ලක්ෂ විසිහත්දහස් තුන්සිය

තිස්දෙකක් (රු.327,332) සහ රුපියල් හාරලක්ෂ අනූපන්දහසක් (රු.495,000) සඳහා එක් එක් වර්ෂයේ සෑම හයමසකට වරක් අප්‍රේල් සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරන සති විසිහතරේ බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. ආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහල අනුපාතිකයක් වන ආසන්නතම ඉහළ වාර්ෂික අනුපාතිකය ලෙස 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොලිය ද රුපියල් හතලිස් ලක්ෂයක් (රු.40,00,000) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරන බර තැබූ සති දොළහේ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) වර්ෂයකට සියයට අටක් (8%) ඉහල අනුපාතිකයක් වන ආසන්නතම ඉහල වාර්ෂික අනුපාතිකය ලෙස 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොලිය ද රුපියල් පහලොස් ලක්ෂයක් (රු.15,00,000) සඳහා වර්ෂයකට සියයට විස්ස (20%) බැගින් පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ යන්ත්‍ර සූත්‍ර හා එහි පිහිටි වෙනත් සියළු දේ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී අංක 170, 516, 278, 996, 818, 247, හා 248 දරන උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 170, 516, 278, 996, 818, 247, හා 248 දරන උකස් බැඳුම්කර මගින් එකී චන්ද්‍රලතා තන්ත්‍රිගේ සන්තෝස් නොහොත් චන්ද්‍රලතා සන්තෝස් විවාහයට පෙර තන්ත්‍රිගේ යන අය විසින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය සහ යන්ත්‍ර සූත්‍ර හා එහි පිහිටි වෙනත් සියලු දේ කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 170, 516,278, 996, 818, 247, හා 248 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

බස්නාහිර පලාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත් කෝරළේ, දාසිය පත්තුවේ, මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ, මාබෝදල උපකාර්යාල බල ප්‍රදේශ සීමාව ඇතුළත ගනිහිමුල්ල ග්‍රාමයේ පිහිටි කහටගහවත්ත නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු ජී. එල්. විජේවර්ධන මැන සකස් කළ අංක 210 සහ 1994 ඔක්තෝබර් මස 13 වැනි දින දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන් කල බිම් කට්ටිය වූ ලොට් අංක 1 ලකුණු කළ බිම් කට්ටියට මායිම් උතුරට : සයිමන් පෙරේරාට අයිති ඉඩම ද, නැගෙනහිරට : පාර ද, දකුණටः සහ බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද යන මායිම් ඇතුළත එකී අංක 210 දරන පිඹුර ප්‍රකාර අක්කර දෙකක් (අ. 2, රූ. 0, පර්. 0) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

අංක 818, 247, හා 248 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

| *විස්තර* | *ප්‍රමාණය* |
|---|---|
| ෆන්කි ඉන්කියුබේටරය සහ හැචරිය (ලොකු) 30025 ඉන්කියුබේටරය, 100H හැචරිය, ඩෙන්මාක්, 1994 සීරියල් අංකය 6BC+ 20-0901/266 | 1 යි |
| ෆන්කි කුඩා ඉන්කියුබේටරය සහ හැචරිය ඩෙන්මාක් 1992 සීරියල් අංකය 6BC+ 10-0901/115 | 1 යි |

ජී. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5. ගාලු පාර,
කොළඹ 3.

11-1108

---

**සෙලාන් බැංකුව පීඑල්සී-හොරණ ශාඛාව**
**2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමු පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2012 ඔක්තෝබර් මස 12 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0230 - 00050660-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිවි 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් එන්. එන්. විජේරත්න විසින් දෙකම සහතික කරන ලද 2006 මැයි 4 දිනැති අංක 22 සහ 2010 අගෝස්තු 4 දිනැති අංක 208 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, හොරණ ව්‍යාපාර ලියාපදිංචි අංක ඩබ්ලිව්/ඩීඩී/4853 දරන මෙසස් අජිත් මෝටර්ස් ඇන්ඩ් එන්ටර්ප්‍රයිසස් යන නාමය, විලාශය සහ අභිධානය යටතේ දෙදෙනාම හවුල් ව්‍යාපාරයක් පවත්වා ගෙන යන මහවත්තගේ අජිත් ජේමසිරි සහ ප්‍රිශාන්ති කුමුදිනී මහවත්ත හෙවත් ප්‍රිශාන්ති කුමුදිනී බැද්දගේ යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් තුන්කෝටි හැත්තෑහත් ලක්ෂ හතලිස් නව දහස් හයසිය හැට හයයි ශත හැට හයක (රු.37,749,666.66) මුදලක්, 2012 සැප්තැම්බර් මස 10 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 37,749,666.66 මුදල ද, 2012 සැප්තැම්බර් මස 11 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් එකයි (31%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහතකී බැඳුම්කර අංක 22 සහ 208 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තා වූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය

මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුවේ පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ මහනගර සභා සීමාව තුළ කුප්පියාවත්ත, වෝඩ් අංක : 32, කුලරත්න මාවත පිහිටි බලයලත් මිනින්දෝරු පී. වේතසලම් විසින් සාදන ලද 1997 මැයි 12 දිනැති අංක : 239/97 දරන සැලැස්මේ නිරූපනය වන කොළඹ 10, දෙවෙනි මරදාන කොට්ඨාසය, වරිපනම් අංක 725 දරන පරිශ්‍රය පිහිටි ජම්බෝගහවත්ත නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : කුලරත්න මාවත වරිපනම් අංක 723 දරන පරිශ්‍රය ද නැගෙනහිරට : කුලරත්න මාවත අංක 712/5 දරන පරිශ්‍රය සහ පන්සල පාර අංක 23 ද, දකුණට : කුලරත්න මාවත වරිපනම් අංක 727 පරිශ්‍රය සහ පන්සල පාර අංක 5/2, 17 සහ බස්නාහිරට : කුලරත්න මාවත ද යන මායිම් තුළ එකී අංක 239/97 දරන සැලැස්ම අනුව පර්චස් නවයයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 9.50) ක් විශාල, එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව ඒ 1153/93 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

වී. ඒ. පරණගම මිය,
ප්‍රධාන කළමනාකාරිනී - නීති

11-1103

---

### ඩීඑෆ්සීසී බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2012 සැප්තැම්බර් 26 වැනි දින දී ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ඩීඑෆ්සීසී බැංකුව නමට බද්දේගම ප්‍රසිද්ධ නොතාරිස් කේ. ජේ. ටී. එල්. නන්දන විසින් ලියා සහතික කරන ලද අංක 6414 හා 2010 අප්‍රේල් මස 16 වැනි දින දරන උකස් බැඳුම්කරය මත ද ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. එෆ්. නධියා, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. බස්නායක සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සී. පී. ඩබ්ලිව්. මීගහවෙල ලියා සහතික කළ අංක 2735/90/61 හා පිළිවෙලින් 2011 සැප්තැම්බර් මස 05 වැනි දින ද, 2011 සැප්තැම්බර් මස 07 වැනි දින ද, 2011 සැප්තැම්බර් මස 14 වැනි දින ද දරන උකස් බැඳුම්කරය මත ද අයවිය යුතු මුදල් ගෙවීම්, ගාල්ල, පින්නදූව, නව නගරයේ පිහිටි "යූ. කේ. එම්. සුපර් සිටි" යන නාමය අභිධානය සහ ආයතනය යටතේ ව්‍යාපාරය කරගෙන යන කරසිංහ ආරච්චිගේ සිසිර කුමාර යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද 2012 ජූනි මස 30 වැනි දිනට ඉහත කී කරසිංහ ආරච්චිගේ සිසිර කුමාර යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් එක්කෝටි විසිලක්ෂ හැටහත් දහස් හයසිය අසූඑකකුත් ශත හැත්තෑනවයක (රු. 1,20,67,681.79) මුදලක් සහ 2012 ජූලි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් එක්කෝටි හත්ලක්ෂ හැට දහස් හාරසිය පහළොවක් (රු. 1,07,60,415) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කර ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරන මෙහි පහත දැක්වෙන පාදක පොලී අනුපාතික අතරින් එනම්:

* බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්.) ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය ; හෝ

* රඳවා ගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතිකයට ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය ;

යන මෙයින් ප්‍රතිශෝධන දිනයේ දී බලාත්මකව පැවති වඩා ඉහල අනුපාතිකයට සියයට හතක (7%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල රුපියල් එක්කෝටි විසිලක්ෂ හැටහත් දහස් හයසිය අසූඑකකුත් ශත හැත්තෑනවයක (රු. 1,20,67,681.79) මුදල සහ 2012 ජූලි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් එක්කෝටි හත්ලක්ෂ හැට දහස් හාරසිය පහළොවක් (රු. 1,07,60,415) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරන මෙහි පහත දැක්වෙන පාදක පොලී අනුපාතික අතරින් එනම්,

* බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්.) ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය ; හෝ

* රඳවා ගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතිකයට ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය ;

යන මෙයින් ප්‍රතිශෝධනය දිනයේ දී බලාත්මකව පැවති වඩා ඉහල අනුපාතිකයට සියයට හතක (7%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකය මත පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි සියළු දේ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී අංක 6414 සහ අංක 2735/90/61 දරන උකස් බැඳුම්කරවල ප්‍රඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමඟ අයකර ගැනීම සඳහා ඉහත කී අංක 6414 සහ අංක 2735/90/61 දරන උකස් බැඳුම්කර මගින් එකී කරසිංහ ආරච්චිගේ සිසිර කුමාර විසින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 6414 සහ අංක 2735/90/61 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාලු කඩවත් සතර ඇතුළත, අක්මීමන ප්‍රාදේශීය සභා බලප්‍රදේශ සීමාවේ, පින්නදූවේ පිහිටි කලුගල්මාවත මගදෙණිය කුඹුර සහ ඊට යාවූ කැටකැලගහදූව නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු එන්. එෆ්. ද එස්. උෟරගොඩ මැන සකස් කළ අංක 59A හා 1936 අප්‍රේල් 22 දින දරන පිඹුරේ දැක්වෙන ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබෙන, ලොට් අංක 4 ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටිය වූ උතුරට සහ උතුරු-බස්නාහිරටඃ මෙම ඉඩමේ ලොට් අංක 8 ලෙස ලකුණු කළ පාරක් සඳහා වෙන්කර තිබෙන බිම ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් අංක 5 ද, දකුණු-නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් අංක 7 ද, දකුණු-බස්නාහිරට : පාර ද, යන මායිම් ඇතුළත පර්චස් තිස්හතරකුත් දශම දෙකයි පහක් (අ.0, රූ. 0, පර්. 34.25) බිම් ප්‍රමාණයෙන් යුක්ත ඉඩම සහ එහි පිහිටි ගසකොළ, වැවිලි, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ.

මෑතකදී කරන ලද මැනීමකට අනුව ඉහත සඳහන් බිම් කට්ටිය මෙසේ විස්තර කර තිබේ.

ඉහත කී පින්නදූවේ පිහිටි කලුගල්මාවත මගදෙණිය කුඹුර සහ ඊට යාවූ කැටකැලගහදූව නැමති ඉඩමේ, බලයලත් මිනින්දෝරු කේ. ජී. සමරසේකර මැන සකස් කළ අංක 1032 හා 2006 පෙබරවාරි මස 21 වැනි දින දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන්කළ බිම් කට්ටිය වූ ලොට් අංක 4 ලකුණු කළ බිම් කට්ටියට මායිම්, උතුරු-නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් අංක 5 සහ 6 ද, දකුණු-නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් අංක 7 ද, දකුණු-බස්නාහිරට : පාර ද, උතුරු-බස්නාහිරට : පාර සහ මෙම ඉඩමේ ලොට් අංක 8 ද, යන මායිම් ඇතුළත පර්චස් විසි නවයකුත් දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 29.50) බිම් ප්‍රමාණයෙන් යුක්ත ඉඩම සහ එහි පිහිටි ගසකොළ, වැවිලි, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 3.

11-1109

---

**මහජන බැංකුව**

වෙන්දේසිකරු වෙනස් කිරීම

මහජන බැංකුවේ, පුත්තලම දිස්ත්‍රික්කයේ පහත සඳහන් ශාඛාවලට අදාළව පුවත්පත් වල පළ කරන ලද වෙන්දේසි යෝජනාවල, බලයලත් වෙන්දේසිකරු වශයෙන් මීගමුව බලයලත් වෙන්දේසිකරු වන ඩබ්. පී. සී. පෙරේරා මහතා නම්කර ඇති අතර, ඒ වෙනුවට කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම යන අයව මහජන බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය BP350-2010 පත්‍රිකාව මගින් 2010.08.27 දින නම් කර ඇති බව දන්වා සිටිමු.

| *ශාඛාව* | *උකස්කරුගේ නම* | *අනුමත වෙන්දේසි යෝජනා පත්‍ර අංකය හා දිනය* | *පුවත්පත්වල පළ වූ දිනය* | *ගැසට් පත්‍රයේ පළ වූ දිනය* |
|---|---|---|---|---|
| මහවැව | ආර්. ටී. නිලන්ත ප්‍රනාන්දු | 676/2008<br>2008.12.19 | 2009.06.23 | 2010.05.21 |
| | එම්. ආර්. කේ. ප්‍රනාන්දු | 135/2010<br>2010.03.26 | 2010.09.13 | 2010.09.24 |

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
පුත්තලම ප්‍රාදේශිකය.

මහජන බැංකුව,
පුත්තලම ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
මාරවිල පාර, නාත්තන්ඩිය.

11-1114

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.